

ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධන මහතා



# අදීන ජාතියකට මඟ පෙන්වන **පත්තර මහගෙදර**

මෙරට නිදහස වෙනුවෙන් දිවි දෙවැනි කොට කැපවූ විරුවන් රැසකි. ඒ එකිනෙකා විවිධ අංශ ඔස්සේ කටයුතු කළේ එකම නිදහසක් වෙනුවෙනි. ඒ අනුව වර්ෂ 1948දී ලැබුණු නිදහස වෙනුවෙන් ඩී. ආර්. විජයවර්ධනයන් නිහඬව කළ මෙහෙවර සදාතනිකය. ලිබරල්වාදියකු ලෙස ඔහු වාමාංශික වේදිකාවේ විවේචනවලට ලක් වුව ද නිදහස්, නිවහල් ජාතියක් ලෙස මෙරට වැසියනට නැඟී සිටින්නට ලේක්හවුස් ආයතනය ලබා දුන් දිරිය කෙලෙස අමතක කළ හැකි ද? ඩී. ආර්. විජයවර්ධනයන්ගේ මූලිකත්වයෙන් ඇරඹි පුවත්පත් නිදහස වෙනුවෙන් කටයුතු කළ අයුරු මෙසේ සැකෙවින් දක්වමු.

කොළඹ නගරයේ හදවත බඳු ස්ථානයක කීර්තිමත් වෘත්තීය ආයතනයක් ලෙස ලේක්හවුසිය ස්ථාපිත වූයේ විජයවර්ධනයන්ගේ කැපවීම, දක්ෂතාව, ධෛර්යය හා දැක්ම නිසාය.

## ජාතික වගකීම

විජයවර්ධන මහතා මෙරට ඉතිහාසය තුළ අමරණීය වන්නේ අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිතයක් බවට පැවති ලංකාවට ව්‍යවස්ථාපිත නිදහසක් ලබා දීම සඳහා සිදු වූ මෙහෙය සුවිශේෂ මෙහෙය නිසාය. ඒ මෙහෙය ලේක්හවුසිය හා විජයවර්ධනයන් අත්වැල් බැඳගත් පුවත්පත් සටනක එක් පැතිකඩක් ලෙසින් හඳුනාගත හැකිය. නිදහස දිනා ගැනීමෙන් පසුව මෙරට පළමු අගමැති වූ ඩී. එස්. සේනානායක මහතා 'නිදහස' ලබාගැනීම වෙනුවෙන් විජයවර්ධනයන් කළ මෙහෙය සලකා නම්බු නාමයක් ලබා දීමට යෝජනා කළ ද විජයවර්ධනයන් එය ප්‍රතික්ෂේප කළේ තම පුවත්පත්වල ස්වාධීනත්වයට, කීර්තිනාමයට ඉන් අවැඩක් වේ යයි සලකා බව විජයවර්ධන මහතාගේ සමීපතමයකු වූ ඩේලිනිවුස් පුවත්පතේ හිටපු කර්තෘ එච්. ඒ. ජේ. හුළුගල්ල පවසා තිබේ. එදා ලේක්හවුසිය හා විජයවර්ධන යනු දෙකක් නොව එකකි. නිදහස අරබයා විජයවර්ධන සටන් කළේ තම පුවත්පත් ඔස්සේය. නිදහස වෙනුවෙන් විජයවර්ධන කළ කාර්ය පිළිබඳ ගවේෂණය තවත් අතකින් ලේක්හවුසිය ඉටුකළ කාර්යයම, නැතහොත් ලේක්හවුස් ජාතික පුවත්පත් වන 'දිනමිණ, සිළුමිණ, ඩේලිනිවුස්, ඔබ්සර්වර්' පුවත්පත්වල කාර්යය ලෙස ද අරුත් ගැන්විය හැක්කේ එහෙයිනි.

1915 ඇතිවූ සිවිල් ගැටුම 'දිනමිණ' පුවත්පතේ දැක්ම හා අනාගත අභිලාෂයන් කුළුගැන්වීමක් බවට පත් වූයේ 1910දී ඇති කළ 'මැනිං' ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තුළින් දේශීය ජනයාගේ අභිලාෂයන් කිසිවක් ඉටු නොවන තත්ත්වයන්තුළය.

බ්‍රිතාන්‍ය කිරීටයට විරුද්ධව ජනමතය ඉදිරියට පැමිණි මෙම වකවානුවේදී ආණ්ඩුවේ අදූරදර්ශී ක්‍රියා අතර, එවකට ජාතික නායකයන්ව සිටි බොහෝදෙනෙකු සිරභාරයට ගැනීම ජාතිකත්වය පිළිබඳ අදහස් පිබිදීමට බලපෑ මූලික කරුණක් බවට පත් විය. 1915 සිදු වීමත් සමඟම මෙරට වැසියන්ගේ නිදහස තහවුරු වීම සඳහා ව්‍යවස්ථාමය බලතල හිමිවිය යුතුයි මතයක් ගොඩනැඟීමට දිනමිණ ප්‍රමුඛත්වය ගත්තේය. ඉංග්‍රීසි ආණ්ඩුවට, ඔවුන් නියෝජනය කළ වැව්ලි ප්‍රජාවට යමක් දැනවීමට නම් ඉංග්‍රීසි බසින් ප්‍රකාශයට පත් වන පුවත්පතක් පළ කිරීම අත්‍යවශ්‍ය බව තේරුම් ගත් විජයවර්ධන මහතා 1918 ජනවාරි 3 'ඩේලිනිවුස්' පුවත්පත ප්‍රකාශයට පත් කෙරෙන්නේ කලක් තිස්සේ පුල පුලා අපේක්ෂා කළ කරුණක් මුදුන්පත් කර ගැනීමක් ලෙසයි.



හොඳිම් මෙහෙවර

පළමු 'ඩේලිනිවුස්' පුවත්පතට සුබ පැතුමක් එක්කරමින් පොන්නම්බලම් රාමනාදන් මහතා විශේෂ පණිවුඩයක් නිකුත් කරමින් මෙසේ පවසා ඇත.

## අභියෝග ජය ගැනීම

'ඩේලිනිවුස්' පුවත්පත උපත ලබන මේ මොහොත වාසනාවන්තයි. අලුත් බලවේග අප සමඟ මෙහෙයට පැමිණ ඇත. රටට නව යුගයක් උදා වන මොහොතක ජාතියට ඇගේ දරුවන්ගේ මෙහෙය අවශ්‍යයි. මෙම අලුත් පුවත්පතට වඩා තවත් අභීත මෙහෙයක් වෙනත් නොමැති බව මට හොඳටම විශ්වාසය. මේ අනුව 1920 ඇතිවූ දෙවන මැනිං (මැනිං ඩෙවෙන් ෂෙයර්) ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවලට 1915 කෝලාහලය බලපෑ අතරම ඒ සඳහා ලේක්හවුස් පුවත්පත්වල බලපෑම ද සැලකිය යුතු මට්ටමක පැවතිණි. නිදහස දිනාගැනීමට ඩේලිනිවුස් කළ කැපවීම පිළිබඳව ඩී. ආර්. විජයවර්ධන මහතා මුලින් ලිපියෙහි මෙලෙස සඳහන් කරයි.

'සැනසීමට සුප්පුවක් කටට දෙන ආකාරයෙන් දෙන නිදහස ලබා ගැනීමට ද ඩේලිනිවුස් පත්‍රය නොකැමැති විය. මැනිං ප්‍රතිසංස්කරණ වශයෙන් ඉදිරිපත් වූ තාවකාලික සැනසිලි යෝජනා අවඥාවට භාජනය කරමින් 1924 ආණ්ඩුක්‍රම

**මෙරට වැසියන්ගේ නිදහස තහවුරු වීම සඳහා ව්‍යවස්ථාමය බලතල හිමිවිය යුතුය යන මතය ගොඩනැඟීමට දිනමිණ ප්‍රමුඛත්වය ගත්තේය. ඉංග්‍රීසි ආණ්ඩුවට, ඔවුන් නියෝජනය කළ වැවිලි ප්‍රජාවට යමක් දැනවීමට නම් ඉංග්‍රීසි බසින් ප්‍රකාශයට පත් වන පුවත්පතක් පළ කිරීම අත්‍යවශ්‍ය බව තේරුම් ගත් විජයවර්ධන මහතා 1918 ජනවාරි 3 'ඩේලිනිවුස්' පුවත්පත ප්‍රකාශයට පත් කෙරෙන්නේ කලක් තිස්සේ පුල පුලා අපේක්ෂා කළ කරුණක් මුදුන්පත් කර ගැනීමක් ලෙසයි.**

ව්‍යවස්ථාවෙහි දැක්වුණු අඩුපාඩු නිර්දය ලෙස ඩේලිනිවුස් පත්‍රය විවේචනය කළේය. එය රටවැසියන් තුළ වැඩෙමින් පවතින දේශපාලන අවබෝධඥානයට සමච්චල් කිරීමක් ලෙස එමඟින් හඳුන්වනු ලැබීය. ඩොනමෝර් යෝජනා ක්‍රමය ස්ථාපිත කරවනු ලැබූ අවස්ථාවට පිවිසි කල්හි 'ඩේලිනිවුස්' පුවත්පත එම ආණ්ඩු ක්‍රමයෙහි ඇති අඩුපාඩු ඉවත් කරන ලෙස උද්ඝෝෂණ ව්‍යාපාරයක් මෙහෙයවීය. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වගකිවයුතු ආණ්ඩුවක් වශයෙන් හිමිකර දී තිබෙන නිදහස් අංග ස්වල්පය ද එහි ඇති 'කොමිටි ක්‍රමය' නිසා අහෝසි වී යන බව එමඟින් පෙන්වා දෙනු ලැබීය.

'ඩේලිනිවුස්' පුවත්පත අප්‍රතිහත ධෛර්යයකින් හා එඩිතර බවකින් යුතුව කැබිනට් මණ්ඩල වගකීමකින් යුතු පාර්ලිමේන්තු ආණ්ඩු ස්වරූපයේ පාලන ක්‍රමයක් ලබා දෙන ඉල්ලීම් ඉදිරිපත් කළේය. ඩේලිනිවුස් පුවත්පත 1922 දී ප්‍රකාශයට පත්කෙරුණු අවස්ථාවෙහිදී ඒ දෙස අවඥාවෙන් බැලූ අය ඩවුනිං වීදිය වෙත රිංගා රහසිගත සුළුජන කොට්ඨාසයක් අඳෝනාවක් රැගෙන ගිය අයම වූහ. එම ද්‍රෝහීනට අනුකම්පාවක් අප පුවත්පත්වලින් කිසිවිට නොලැබුණි.

එහෙත් 'ඩේලිනිවුස්' පුවත්පත කිසිවිට නිල බලය ඉදිරියේවත් කල්ලිකාර කණ්ඩායම්වලට අතදීම් වශයෙන්වත් තම ප්‍රතිපත්ති පාවාදීමෙහි කිසිවිට නොයෙදිණි. අයිතිකරුවන් හැටියට ලේක්හවුස් පුවත්පත්වලට දේශපාලන අරමුණු සපුරා ගැනීම පිණිස 'සපත්තු පහර' දීමට කිසිවෙකු නොවීය. එම පුවත්පත්වල නිරත කාර්යය වූයේ ශ්‍රී ලංකාවාසී සියලුම දෙනාට සම තැන සැමවිට පොදු රාජ්‍ය මණ්ඩලීය වැසියන් අතරත්, මුළුමහත් ලෝකයේමත් නිදහස හා සමාන හිමිකම් ඇති පෞරුෂයක් වශයෙන් හැසිරීමට ඉඩ ලබා දීමය.'

## කැපවීම

ඩේලිනිවුස් පුවත්පත ඇරඹීමෙන් පසුව ඩී. ආර්. විජයවර්ධනයන්ගේ පුවත්පත් ව්‍යාපාරය වඩාත් දියුණු විය. 1923 විජයවර්ධන මහතා විසින් ඔබ්සර්වර් පුවත්පත මිලයට ගැනීමත්, සිංහල පාඨකයන් සඳහා සිළුමිණ ආරම්භ කිරීමත් නිසා තම පුවත්පත් ව්‍යාපාරය වඩාත් බලපෑම්සහගත බලයක් ලෙස ගොඩනැඟීමට විජයවර්ධන මහතා සමත් විය. ඔහු ලත් බ්‍රිතාන්‍ය අධ්‍යාපනය මෙන්ම ගොඩනඟා ගත් ජනමතය හැසිරවිය හැකි බලය කොතෙක්ද යත් 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා බලපෑම් කළ සිංහල නායකයන් අතර, මූලිකත්වය ගැනීමට ඔහුට හැකියාව ලැබිණි.

1948 නිදහස ලැබීමට පෙර ඒ පිළිබඳව කරුණු පරීක්ෂා කිරීමට පැමිණි සෝල්බරි සාමිවරයා ද විජයවර්ධන මහතාගේ ආගන්තුක සත්කාර ලැබීය. දියතලාවෙහි වූ විජයවර්ධන මහතාට අයිති 'ආකේඩියා' නම් සුරම්‍ය ප්‍රශස්ත නිවෙසෙහි ඔහුගේ ආගන්තුකයින් හැටියට කොමසාරිස්වරු සති අන්තයේ ගත කළහ. කොමිසමේ සභාපති සෝල්බරි සාමි 1945 අප්‍රේල් මස 6 වැනි දින විජයවර්ධන මහතා වෙත මෙසේ ලිපියක් ලියයි.

"හෙට උදේ අප පිටත්ව යන බැවින් ඔබට ආයුබෝවන් කීමටවත් අවස්ථාවක් නොවීම ගැන කනගාටු වෙමි. මටත්, කොමිසමටත් ඔබ කළ සියල්ල ගැන අවංකව ස්තුතිය පිරිනැමීමට මේ ලිපිය ලියමි. ඔබ අපට දුන් උපදෙසුත්, දුන් ආධාරත් දුෂ්කර ප්‍රශ්නයක් විසඳීමට අපට ඉමහත් උපකාරයක් විය හැකිය. අද ඩේලිනිවුස් පුවත්පතේ අප ගැන කාරුණික වූත්, උදාර වූත් වචනවලින් ලියා තිබුණ කතුවැකිය අපට කොතරම් ප්‍රසාදජනක වීද යත් මම ඒ ගැන කෘතඥ වෙමි.

## පරිශ්‍රමය

සෝල්බරි සාමිවරයා සිය වාර්තාව නිල වශයෙන් ඉදිරිපත් කර තිබුණේ 1945 ජූලි 11 වැනිදාය. 1948 පෙබරවාරි 08 වැනිදා නිදහස ලැබීම සඳහා මූලික වශයෙන්ම බලපෑවේ එම වාර්තාවයි. එච්. ජේ. හුළුගල්ල, ඩී. ආර්. විජයවර්ධන චරිතාපදානයේදී මේ පිළිබඳව විස්තර කර ඇත්තේ මෙලෙසය. "ඔහුගේ පුවත්පත්වලින් ලංකාවේ නිදහස් පරිශ්‍රමයට රුකුලක් ලැබුණු බවට සැකයක් නැත. එහෙත් සාර්ථක පුවත්පත් හරහා තමාට ලැබෙන බලය ගැන ද ඔහු කරුණු වටහා ගත්තේය. ඒ අනුව එම බලතල පාවිච්චි කිරීමට ද ඔහු මැළි නොවීය. පුවත්පත මඟින් ප්‍රබල ප්‍රචාරයක් ගෙන ගිය විට ඇතැම් අවස්ථාවලදී මහත් බාධක පවා මැඩගෙන ජයගත හැකි බව විජයවර්ධන මහතා තදින්ම විශ්වාස කළේය.'

1948 ලැබුණ 'නිදහස' සඳහා ඩී. ආර්. විජයවර්ධනයන්, ලේක්හවුස් ආයතනයත් කොතෙක් දුරට දායක වීද යත් පූර්ණ නිදහස නොලැබී ඩොමිනියන් තත්ත්වයේ නිදහසක් හිමිවීමට විජයවර්ධනයන්ගේ බලපෑම හේතු වූ බවට වාමාංශික වේදිකාවේ විජයවර්ධන මහතා සහ ලේක්හවුස් 'පුවත්පත්' විවේචනය කරන තත්ත්වයක් ඇති විය. ලිබරල්වාදියෙකු ලෙස වාමාංශික වේදිකාවේ විජයවර්ධන සහ ඔහුගේ පුවත්පත් කොතෙක් විවේචනය වුවද මෙරට පුවත්පත් ඉතිහාසයේ විජයවර්ධනයන්ට හිමිවූ අනභිභවනීය ස්ථානයත් 'නිදහස්' නිවහල් ජාතියක් ලෙස මෙරට වැසියනට නැඟී සිටින්නට ලේක්හවුස් පුවත්පත් ලබා දුන් දිරියත් කිසි කලෙක ලඝු කළ නොහැක්කකි. ඒ මතු මතු ද කියැවෙන්නකි. ගරු බුහුමනට ලක් වන්නකි. ඒ අභිමානය පෙරදැරිව මේ නිදහස් සමරුවේදීත් ලේක්හවුසිය රට, දැය වෙනුවෙන් අතිමහත් මෙහෙවරක නියැළෙන්නේ ජාතික වගකීමකින් යුතුවය.

**බුද්ධිකා බ්‍රාහ්මණගේ**